2025. 02. 24 ලංකාදීප

# ජාතික උද්ධමනය සෘණ 4.0 ක්

යොහාන් හාසුර

මෙරට උද්ධමනය ජාතික පාරිභෝගික මිල දර්ශකය පසුගිය ජනවාරි මාසය සඳහා සියයට සෘණ 4.0 ක් දක්වා අඩු වී ඇති බව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව නිවේදනය කරයි. ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව 2025 ජනවාරි මාසය සඳහා ශ්‍රී ලංකාවේ ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද.) සහ මාසික පාරිභෝගික උද්ධමනය ප්‍රකාශයට පත්කළේය.

ඒ අනුව 2024 දෙසැම්බර් මාසයේ දී සියයට සෘණ 2.0 ක් ලෙස වාර්තා වූ මෙරට උද්ධමනය ජනවාරි මාසය සඳහා සියයට සෘණ 4.0 ක් දක්වා අඩු වී ඇති බවත් දෙසැම්බර් මාසයේදී සියයට සෘණ 1.0 ක් ලෙස වාර්තා වූ ආහාර කාණ්ඩයේ ලක්ෂ්‍යමය උද්ධමනය ජනවාරි මාසයේ සියයට සෘණ 2.5 ක් දක්වා අඩු වී ඇති බවත් එම දෙපාර්තමේන්තුව කියයි. දෙසැම්බර් මාසයේ සියයට සෘණ 2.9 ක් වූ ආහාර නොවන කාණ්ඩයේ ලක්ෂ්‍යමය උද්ධමනය ජනවාරි මාසයේ සියයට සෘණ 5.2 ක් දක්වා අඩු වී ඇති බව ද ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව පවසයි.